
# කවි කොළය ✻



**කොතරම් සමීපව සිටියත් දිනක සියල්ල දමා යන්නට සිදුවේ...**

## සත්‍යය දිහා ඇස් ඇර බලන්න !

උපත මෙන් මරණයද දුක වේ
පියන්ගෙන් වෙන්වීම දුක වේ
ජරා රෝ ඈ දුකින් සවිසත
පෙළෙත් දුකමයි සියළු පැත්තේ

දුකෙන් මිදුමේ මඟක් වේදැයි
සොයා ගිය මහ විදුදරාණෙනි
ඔබය දුටුවේ එමග නැණැසින්
වෙනත් කිසිවෙකු නොදක්නා ලද

මමය මාගේ කියන බලවත්
හැඟීමෙන් මිනිහා වෙලී ඇත
මමත්වය වේ දුකට හේතුව
මමත්වය වේ බියට හේතුව

මමය මාගේ කියන තණ්හා
කෙළෙස් මළ පිස දැමූ කල්හී
භයද ශෝකය පළා යනු ඇත
දුකින් මිදුමේ රහස එයවේ

උපත සමගින් සිත් උයන් හී
රෝපණය වූ කුඩා බීජය
වනස්පතියක් බවට පත්වී
තිබෙයි අක් මුල් විහිද තණ්හා

දමා අතු ඉති වැඩුණු මේ ගස
මුලින් උදුරා දමත හැකි යම්
කෙනෙක් වෙත් නම් ඒ තැනැත්තා
නිවන් දුටුවා යයි සිතන්නෙමි

නිවන යනු තව දෙව්ලොවක් යයි
සිතන පුහුලෝ නිවන් දක්නට
කරති දන් පින් පතා දිව සැප
පොහොර සපයති ගසට තණ්හා

මගේ දරුවා බිරිඳ නෑයා
මගේ වස්තුව සමග සිරුරද
අයිත් නැත මට සිතා මේ ලෙස
බැඳුම් බිඳහළ කෙනෙහි ආශා
පලා යනු ඇත දුකද හීතිය

මහණ දම් පිරුවෙකුට මිස එය
ගිහිව සිටිනා අපට කළැකිද
රහත්බව ලත් කිසිම ගිහියෙකු
නුදුටුවෙමි පත පොතක කිසිදා

♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**

# මර්වින් සිල්වා දුටුගැමුණු වූ දා



**ඉ**හත දැක්වෙන පින්තූර විදහා දක්වන්නේ රජකෙනෙකු ඇතා පිට ගමන්ගන්නා ආකාරයයි. ඔහු යුද්ධය කට යන බව පෙනෙන්නේ හේවායන් කීපදෙනෙකුද බිමින් ඒ අසලින්ම ගමන්ගන්නා අයුරු පෙනෙන විටයි. මේ චිත්‍රපටයකට ගත් දර්ශන වෙති. මේ චිත්‍රපටයට පසුබිම්ව ඇත්තේ දුටුගැමුණු රජුගේ කතාව බව කියනු ලැබේ. දුටුගැමුණු රජතුමාට මෙහි රඟපාන්නේ ශ්‍රී ලංකාවේ වර්තමාන රජයේ මහජන කටයුතු හා සම්බන්ධතා පිළිබඳ ඇමති මර්වින් සිල්වාය. **සුරංගනා ලොවින් ඇවිල්ලා** යනු මේ චිත්‍රපටයේ නමයි. මෙය සුනෙත් මාලිංග ලොකුහේවාගේ නිශ්පාදනයකි. ඉහතකී දර්ශන නොබෝදා සීගිරිය අවට ප්‍රදේශයේදී රූපගත කරනු ලැබිණ.

ඇමති මර්වින් සිල්වා කලක සිට තමා දුටුගැමුණු රජතුමාගේ නෑයෙකු බව කියයි. ඒ නිසාම විරුද්ධ පක්ෂයේ අය ඔහුට කාඩ්බෝඩ් දුටුගැමුණු යයි නමක්ද පට බැඳ ඇත. මේ චිත්‍රපටයට මුදල් වියදම්කරන්නේ වෙන කිසිවෙකු නොව ඔහුම බවද කියති.

මර්වින් සිල්වා දුටුගැමුණුට රඟපාන බව පුවත්පත්වල පළවීමෙන් පසු නොයෙක් දෙනා නොයෙක් මත පළකරන්නට පටන්ගෙන ඇත. ඒ මත සියල්ලම වාගේ ලියැවී තිබුණේ ඔහුගේ ඒ චරිත නිරූපණය හෙළාදකිමිනි.

වෙබ් අඩවි කීපයකම මර්වින්ට පහරගසා තිබුණු අතර ඒ කවුරුත් එක හඬින් කියන්නේ මෙය නම් දුටු ගැමුණු වැනි උදාර රජකෙනෙකුට කරන ලද විශාලම අවමානය සහ නින්දාව බවයි.



**මර්වින් සිල්වා රජතුමා**

♦ **කීර්තිනන්ද** *Essex*

# Congo 'rape capital of the world'
# ස්ත්‍රී දූෂණයට ප්‍රසිද්ධ රට කොංගෝව



**Distressed young rape victims at a Care Centre**
දූෂණයට ලක්වූ දැරියන් පිරිසක් සැලකුම් මධ්‍යස්ථානයක

The Democratic Republic of Congo is **the rape capital of the world**, a senior UN official has said.

More than **8,000** women were raped during fighting in 2009, the UN says. “ Women have no rights, if those who violate their rights go unpunished, ” an official told the UN Security Council on her return from DR Congo.

Congo is still plagued by army and militia violence despite the end of the country's five-year war in 2003. According to statistics gathered by CARE - an NGO, women reported over **3,500** cases of sexual violence between January and September last year. “ The actual number is unimaginable” a UN report says. “ Women don't come forward for fear of rejection, reprisal, and because of continued insecurity. They need safety, medical care, support and encouragement, and this is a crucial gap in DR Congo today. ”

**අ**ප්‍රිකා රාජ්‍යයේ ඇති කොන්ගෝ ජනරජය ලෝකයේ ස්ත්‍රී දූෂණය සඳහා නම් දැරූ නගරය යයි දැන් හඳුන්වනු ලැබ ඇත. විවිධ කණ්ඩායම් හා රජයේ හමුදා අතර නිරන්තර කලබල හා සටන්වලින් පිරී තිබෙන කොන්ගෝවේ 2009 වසර තුළ පමණක් ගැහැණුන් **8000** ක් දූෂණය කරනු ලැබ ඇතැයි එක්සත් ජාතීන්ගේ කමිටුවක වාර්තා පෙන්වයි. කෙයාර් නමැති සංවිධානය පවසන අන්දමට, ගිය වසරේ ජනවාරි සහ සැප්තැම්බර් මාස **9** තුළ පමණක් කොන්ගෝවේ කාන්තාවන් **3500** ක් දෙනා දූෂණය ඇතුලු ලිංගික අතවරවලට මුහුණ පා තිබේ.

ඇත්ත ගණන ඊට වඩා වැඩිය. ප්‍රශ්නය වී ඇත්තේ පැමිණිලිකරන්නට එන අය සුළු ප්‍රමාණයක් වීමයි. එයට හේතුව බය හා ලැජ්ජාවද පැමිණිලි කළහොත් තවත් හිංසාවන් සිදුවේ යයි ද, තම සැමියන් ගෙන් නිග්‍රහ සහ හිරිහැර පැමිණෙතැයි යන බිය නිසාද, බොහෝ අප්‍රිකානු කාන්තාවන් ඉදිරියට නොඑන බවද කෙයාර් වාර්තාව සඳහන් කරයි.



**ඉරිදා- SUN** මම මේ නිකම් ඉන්න ගමන් කල්පනා කෙරුවෙ බටහිර මාධ්‍යකාරයො ගැන. පෙන්නන්න කොහේවත් ප්‍රවෘත්තියක් නැතුව ඇඹරි ඇඹරි ඉන්නකොට කොහේ හරි මොකක් හරි සෙට්වෙනවා. භූමිකම්පාවෙන් ජපානෙ විනාස වෙච්ච හැටි මාසයකට වැඩිය පෙන්නුවා. ඒක ඉවරවෙන කොට ඊජිප්තුවට ලිබියාවට ගැහුවා. ඊළඟට රාජකීය මංගල්ලෙ ආවා. ඒකත් නැතිවෙන කල් පෙන්නුවා. ඒකෙ ආටෝපෙත් දැන් ඉවරයි. ඒක ඉවරවෙනවත් එක්කම බින් ලාඩන්ව මැරුවා. මාස කීපයක් දිගට ඇද ගෙන යන්න දැන් ඒ කාරණේ ඇති. ලෝකෙ ප්‍රශ්න ඇතිවෙන තරමට වාසිය මාධ්‍ය ආයතන වලට තමයි.

**සඳුදා- MON** ප්‍රින්ස් විලියම්ගෙ මගුල දවස් දෙකක් එක දිගට මුළු ලෝකෙටම පෙන්නුවා. එළිවෙච්ච වෙලාවෙ ඉඳලා පල්ලියෙ වතාවත් කරලා උන් දෙන්නා හනිමූන් යන්න පිටත් වෙන කල් කැමරාකාරයො බකිංහැම් මාළිගේ පැත්තෙන් හෙල්ලුනේ නැහැ. එකඅතකට මේ මගුල තවම රජපවුලට යම්කිසි බලයක් තියනවයි රටේ ජනතා වගේ ආදරයක් තියනවයි කියලා ලෝකෙට පෙන්නන්න ගත්තු වෑයමක් මේ. ආර්ථික හා වෙනත් බොහොමයක් දේවල් අතින් වටේට තියන අනික් රටවල් දැනට ඉහළට ඇවිල්ලා. රාජකීයත්වය එංගලන්තෙට නැතිවෙච්ච දාට මේ රටේ වටිනාකමත් බිංදුවට බහිනවා.

**කුජදා - TUE** රාජකීය මගුල් ගෙදර රූපවාහිනියෙන් දැකලා කැතරින් පුංචි අම්මා කඩවත ඉඳලා කතාකෙරුවා ඒකෙ වැඩිවිස්තර මගෙන් අහන්න. පුංචි අම්ම කියනවා දැන් චාර්ල්ස් කුමාරයා හිතන්න බැරි තරම් වයසට ගිහිල්ලය, එදා මගුලට ඇවිත් ඇවිදගෙන ගියෙත් වැටි වැටි බොහොම අමාරුවෙන්ය කියලා. අනික කැමිලත් එක්ක ඉන්න කොට චාර්ල්ස්ගෙ වයස පේනවා වැඩිය කියලා. පුංචි අම්මත් හොයන්නෙනැති දෙයක් නෑ. ඒ පාර කිව්වා අනේ ඩයනා කුමාරි මෙදා හිටියනම් පුතාගෙ මඟුල් දා කොච්චර සංතෝස වේවිද කියලා. මං කිව්වා “ පුංචි අම්මේ අපි කාට නරකට කැතට අජූවට කැමිලපෙනුනත් චාර්ල්ස්ට ඒගැණි බොහොම ලස්සනට පේනව ඇති ” කියලා. “ එහෙනම් ඒ මිනිහගෙ ඇස් පෙනීමත් සෑහෙන්න අඩුවෙලා ඇති ” කිව්වා.

**බුදදා - WED** ලංකාවෙ මේ දවස්වල චිත්‍රපටයක් හදනවා දුටුගැමුණු රජ්ජුරුවන්ගෙ ඓතිහාසික කතා පුවත. මීට ඉස්සෙල්ලා ඒ රජතුමා ගැන චිත්‍රපටයක් කවුරුවත් හදලම නැහැ. ඒවගේ වීර චරිතයක්, නිර්භීත චරිතයක් රඟපාන්න සුදුසු නළුවෙක් දැනට ලංකාවෙ ඉන්නව ද කියලා හිතන්නත් අමාරුයි. ඒ සේරම පැත්තකට දාමු. දැන් මේ චිත්‍රපටියෙ දුටුගැමුණු චරිතය රඟපාන්න තෝරගත්තු නළුවා ගැන ඇහුවම මට හිතුනා මේක අංගොඩ පිස්සන් කොටුවෙ පිස්සො ටිකක් එකතුවෙලා කරන වැඩක්ද කියලා. කවුද මේ දුටුගැමුණු චරිතෙට පණ දෙන්නෙ? ඇමති මර්වින් සිල්වා! මගෙ අම්මෝ ! මේක නම් අපේ පෞඪ ඉතිහාසෙ දැලිගාන්න කවුරුහරි අටවපු උගුලක්. ලංකාදීප පත්තරේ ගිය සතියෙ පළවුණු කාටූන් එකක් මං දැක්කා. පන්සලක හදලා තියන දුටුගැමුණු පිළිමයක් කාගෙන්ද ඉල්ලනවා... “ මට හොඳ කඹයක් ගෙනැත් දියන් එල්ලෙන්න...” කියලා. අයියෝ ! මොකක්ද මේ අපේ ලංකාවට වෙන්නෙ?

**ගුරුදා - THU** පකිස්ථානෙ අයිනෙදි ඇමරිකන් හමුදා බින් ලාඩන් ගිය සතියෙ මැරුවා. ඔබාමා, හිලරි ක්ලින්ටන් ඇතුළු ඇමරිකානු රජයෙ ලොක්කො ප්‍රීතිවෙනවා පෙන්නුවා. ඔබාමා කිව්වා ලෝකෙ දරුණුම ත්‍රස්තවාදියා මැරුවම ලෝකයාම ප්‍රීතිවිය යුතුය කියලා. එතකොට ලංකාව ඊට කලින් හිටි දරුණුම එකා වන ප්‍රභාකරන් මැරුවම ඇමරිකාවයි එංගලන්තෙ ඇතුළු බළුහිර රටවල් ප්‍රීතිවුණේ නැතුව මූණ බුකවගෙන හිටියෙ මොකෝ. අපි දන්නවා හේතුව. මේ එකෙක් හිතුවෙ නැහැ අපේ සොල්දාදුවන්ට ඒ වගේ හපන්කමක් කරන්න පුළුවන් කියලා. මුන් සේරම අපි ගැන හිතුවෙ තුට්ටු දෙකට. කවුරුත් මේ සම්ම ජාතියෙ කරන්න බැහැයි කියපු වැඩේ අපේ හමුදා ලස්සනට ඉවර කරලාම පෙන්නුවා. අන්න පුතේ වැඩ !

**කිවිදා- FRI** ඇමරිකාවම කියනවා බින් ලාඩන්ට හමුදාව වෙඩිතියන වෙලාවෙ ඒ මිනිහා අතේ ආයුධ කිසි දෙයක් තිබුණේ නැත කියලා. දැන් කවුරුත් අහන්නෙ ඇයි උඹලා නිරායුධ මිනිහෙකුට වෙඩිතියලා මැරුවෙ ? ඇයි ඒ මිනිහා අත් අඩංගුවට අරගෙන ජාත්‍යන්තර අධිකරණයට ගෙනාවෙ නැත්තෙ? කියලා. බින්ලාඩන්ගෙ දුව කියනවා ඇමරිකාව අපේ තාත්තා අල්ලගෙන පැත්තකට අරගෙන ගිහින් ඔළුවට වෙඩි තිබ්බය කියලා. මේවා නේද යුද අපරාධ කියන්නෙ? ඇමරිකාව ලංකාවට බොරු චෝදනා අර ගොන් බැංකි මූන්ට ට කියලා දැම්මේච්චට දැන් ඇමරිකාව බෙල්ල ළඟටම අහුවෙලා ඉන්නෙ. ප්‍රභාකරන් මැරුණේ අපේ හමුදාවත් එක්ක කළ සටනෙදි. හමුදාව ප්‍රභාකරන් අත්අඩංගුවට අරගෙන මැරුවෙ නැහැ. ඇමරිකාව හැදුවෙ බොරු යුද අපරාධ චෝදනාවක් අපට පටවන්න. දැන් ලෝකෙම දන්නවා ඇමරිකාව කරපු වැඩේ.